# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2395/27 – 2024 ජූලි මස 31 වැනි බදාදා – 2024.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 මැයි මස 05 වැනි දින අංක 1861/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2014 අංක 94 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වැනි උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් දෙක පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2013/UDA/639.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: නුඑ/3/18/අත්පත්/160.
2024 ජූලි මස 31 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535D, නුවරඑළිය මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුවරඑළිය (කොට්ඨාස අංක 7, නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මූ.පි.නු. 1840 හා 2021.09.06 දිනැති අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 1 – ඔක්ලි කොටේජ් – ප්‍රමාණය: හෙක්. 5.2639**
උතුරට: මූ.පි.නු. 216 හි කැබලි අංක 3 සහ 1; නැගෙනහිරට: මූ.පි.නු. 216 හි කැබලි අංක 1, හි.පි. 188106 සහ හි.පි. 221104; දකුණට: මූ.පි.නු. 216 හි කැබලි අංක 1, හි.පි. 188106, හි.පි. 221104, රජය හිමිකම් කියන ඕක්ලි මුඩුබිම, මූ.පි.ඒ. 986 හි කැබලි අංක 1 සහ ඉහළ වැව පාර; බටහිරට: ඉහළ වැව පාර, බෘෟම් ෆීල්ඩ් මාවත සහ හි.පි. 47591.

02. **කැබලි අංක 2 – ඔක්ලි කොටේජ් – ප්‍රමාණය: හෙක්. 0.6542**
උතුරට: ඉහළ වැව පාර; නැගෙනහිරට: ඉහළ වැව පාර සහ කැබලි අංක 3; දකුණට: කැබලි අංක 3 සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ හි.පි. 48027.

EOG 07 – 0297

1A – G 042352 – 09(2024/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*